*සැ. යු.-* 2009.12.04 දින පළ වූ අංක 1,631 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,632 - 2009 දෙසැම්බර් මස 11 වැනි සිකුරාදා - 2009.12.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 2112 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 දෙසැම්බර් මස 18 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 දෙසැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2009

මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 අනුව මධ්‍යම පළාතට අයත් දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමෙන් මෙම තනතුරු සඳහා පත්කිරීමට තෝරා ගනු ලැබේ.

03. පත්කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. ඒ සම්බන්ධව අවසාන තීරණය ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

04. *වැටුප.*- අංක 06/2006 (IV) හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව කළමනාකරණ සහකාර සේවයේ III, II හා I වැනි පන්තිවලට අදාළ මාසික වැටුප් පරිමාණය අනුව රු. 13,990-10x145-11x170-6x240-4x320-රු. 23230 වේ. රු. 15,440න් ඔබ්බට යාම සඳහා 11 වැනි පන්තියට උසස් වීම ද, රු. 17,310න් ඔබ්බට යාම සඳහා 1 වැනි පන්තියට උසස් වීම ද ලබාගත යුතුය.

05. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය.

5.2 2007.05.28 දිනැති 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුන භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව/භාෂා පිළිබඳ ප්‍රවීනතාවයක් ලබාගත යුතුය.

06. *සුදුසුකම්.*-

*(අ)* අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
*(ආ)* ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 30ට නොවැඩි විය යුතුය.
*(ඇ)* යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
*(ඈ)* පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුයි.

(1) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්වී තිබීම ;

සහ

(2) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණ හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.).

07. *දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරා ගැනීම :*

(i) දිස්ත්‍රික් ජනගහන අනුපාත ක්‍රමය මත වෙන්කල ඇබෑර්තු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කයට අන්තර්ග්‍රහනය කරගනු නොලැබේ නම් එම ඇබෑර්තු සංඛ්‍යාව පළාත තුළ යාබද දිස්ත්‍රික්කවලට නැවත බෙදා හරිනු ලැබේ.

(ii) විභාගයේ දී අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ.

*(අ) ස්ථිර පදිංචිය සඳහා තිබිය යුතු සුදුසුකම් :*

(i) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට මධ්‍යම පළාත තුළ පූර්වාසන්න වසර 05ක කාලය තුළ අනුගාමී වසර 03ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. පදිංචිය සනාථ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් ලිපිලේඛන ඉදිරිපත් කළ යුතුය.

(ii) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය (එම සහතිකයේ 2(අ) හා 2(11) තීරයේ ඡන්ද හිමි නාම ලේඛනය මගින් පදිංචිය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු වන සම්පූර්ණ නම, ඡන්ද නාම ලේඛනයේ අංකය හා ලියාපදිංචිය පිළිබඳ විස්තර සඳහන් විය යුතුවේ.)

08. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධ සහිත පුද්ගලයින් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3%ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබාදීම සඳහා තෝරා ගැනෙනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයින්ගේ ලකුණු මට්ටම යටත් පිරිසෙයින් 50%ක් වත් විය යුතුය. පත්වීමක් සඳහා තෝරා ගනු ලැබූ අපේක්ෂකයකු විශේෂඥ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම ආබාධ සහිත තත්ත්වය හා එය අදාළ තනතුරේ රාජකාරි ඉටුකිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු කළ යුතුය.

09. *විභාග පරිපාටිය.*- බඳවා ගැනීමේ විවෘත තරග විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|
| 1. භාෂා හැකියාව | 100 | පැය 1 1/2 යි |
| 2. අභියෝග්‍යතාවය | 100 | පැය 1යි |

*භාෂා හැකියාව.*-මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත වේ.

*අභියෝග්‍යතාවය.*-මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ.

මෙම විභාගය තරඟ විභාගයක් වුව ද පත්වීම ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන්කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක්වත් (40%) අපේක්ෂකයන් විසින් ලබාගත යුතු අතර, විභාගයේ මුළු ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබා ගත යුතුවේ. තරඟ විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම ලබාදෙනු ලැබේ.

10. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.*-ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුයි. මේ විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද් දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

11. *විභාග ගාස්තු.*- සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් මධ්‍යම පළාත් සභාවට ගෙවිය යුතුවේ. විභාග ගාස්තුව රු. 600කි. එම ගාස්තුව මධ්‍යම පළාත් සභාවේ ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ, ''මධ්‍යම පළාත් සභා ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ : 20-03-20-39ට'' බැරවන ලෙසය. ගෙවනු ලබන විභාග ගාස්තුව කවර හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. (මුදල් ගෙවා ලබාගන්නා රිසිට්පතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබාගත යුතුවේ.)

12. *අයදුම්පත්‍ර.*- මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ-4 (සෙ.මී. 21x29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින්-

*(අ)* අංක 01 සිට 03තෙක් ඡේදයන් පළමු පිටුවට ද,

*(ආ)* අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

*(ඇ)* අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

*(ඈ)* ආබාධිත අයදුම්කරුවන් අයදුම්පතේ ඉහළින් ''ආබාධිත අයදුම්කරුවෙකි'' යන්න හා කුමන ආබාධිතයෙක් ද යන බව **රතු පාටින්** පැහැදිළිව සඳහන් කළ යුතුවේ.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් ඉල්ලුම්පත ප්‍රතික්ෂේප විය හැක.

12.1 විභාගය පැවැත්වීමට යෝජිත නගර හා නගර අංක :

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මාතලේ | 04 |
| මහනුවර | 05 |
| නුවරඑළිය | 06 |

*සැ.යු.*- විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. යම් නගරයකට ඉල්ලුම්කල අපේක්ෂකයන් ගණන ප්‍රමාණවත් නොවේ නම්, දෙවන කැමැත්ත ලෙස සඳහන් කළ නගර වෙත යොමු කෙරෙන අතර, එම දෙවන නගරය සඳහා ද ප්‍රමාණවත් අපේක්ෂකයින් ගණනක් නොසිටියහොත් යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ.

12.2 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට් නිවේදනය* අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12.3 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2010.01.29 වැනි දින හෝ ඊට පෙර ''ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, තැ. පෙ. 114, කටුගස්තොට පාර, මහනුවර'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය 2009'' යන්න හා ඔබ අදාළ වන දිස්ත්‍රික්කය ද සඳහන් කළ යුතුය.

12.4 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ වාර්ෂික වැටුප රු. 2,40,360ක් හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

13. විභාගයට පෙනී සිටීම විභාගය පවත්වන දිනට සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශපත්‍ර විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ඇත. එවැනි ප්‍රවේශපත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විභාග

ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශපත්‍ර නොලැබුණු අපේක්ෂකයන් වෙතොත් ඒ බව පහත සඳහන් විස්තර සමග විභාග කොමසාරිස් ජනරාල්ගෙන් විමසිය යුතුය.

01. විභාගයේ නම :————.
02. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
03. අයදුම්පත ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය, දිනය හා ලියාපදිංචි කුවිතාන්සි අංකය :————.
04. විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සි අංකය, දිනය හා ගෙවන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.

14. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

01. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
02. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15. විභාගය පැවැත්වෙන දිනය විභාග කොමසාරිස් ජනරාල් විසින් යථා කාලයේ දී දැනුම් දෙනු ඇත. සියලුම අයදුම්කරුවන් රජයේ ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

16. මෙම විභාගය පැවැත්වීම, පත්වීම ලබාදීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳ අවසන් තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේ ය.

ඊ. එම්. එන්. එම්. ඒකනායක,
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා
කොමිෂන් සභාව.

2009 නොවැම්බර් මස 25 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 114,
කටුගස්තොට පාර,
මහනුවර.

### ආදර්ශ අයදුම්පත්‍රය

### මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2009

### Open Competitive Examination for Recruitment to Central Provincial Management Assistants Service Class III - 2009

[ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]
සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න).
(මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ).

විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය හා නගර අංකය :

| | නගරය | නගර අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
උදාහරණ : PERERA A. B. C.
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
1.4 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : [ ] ස්ත්‍රී-1, පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
3.2 උපන් දිනය :
වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]
3.3 අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස :
අවු. : [ | | | ] මාස : [ | ] දින : [ | ]

4.0 4.1 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :————.
4.3 පදිංචිව සිටින කාලසීමාව :————.

5.0 *අධ්‍යාපන සුදුසුකම් :*

(i) අ. පො. ස. (සා. පෙළ) විභාගය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

6.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න) :

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

7.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙම කොටුව තුළ අලවන්න
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

8.0 මෙම අයදුම්පතේ ම විසින් සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද මෙම විභාගයේ නීතිරීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම විභාග කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

**9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.......................................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය.........................................................වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :—————.

සහතික කරන්නාගේ නම :—————.
තනතුර හා නිල මුද්‍රාව :—————.

12-360

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.